සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2013

## 9 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය

27223

නම/විභාග අංකය:- ..................................................................................... කාලය: පැය 2යි.

## I කොටස

I කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

- නිවැරදි අක්ෂර වින්‍යාසය යෙදුණු පදය යටින් ඉරක් අඳින්න.

1. පුස්තකාලය තුළ (නිෂ්ෂබ්ද ව/ නිශ්ශබ්ද ව/නිෂ්ශබ්ද ව) හැසිරිය යුතු ය.
2. ලෝක උරුමයක් වූ සීගිරිය (විස්මිත / විශ්මිත /විෂ්මිත) නිර්මාණයකි.
3. සිංහල ජාතිය දියුණු (ශිෂ්ඨාචාරයකට / ශිෂ්ටාචාරයකට / ශිශ්ඨාචාරයකට) උරුමකම් කියයි.

- පහත සඳහන් ඡේදයේ ඉරි ඇඳි පද කවර සාම්ප්‍රදායික යෙදුම් වර්ගයකට අයත් දැ යි ලියන්න.

"ගමරාල සිල් ගත්තා වගේ නැතිව, පනින්ට පෙර සිතා බලා කටයුතු කරන්නැ"යි අම්මා දියණියට පැවසුවාය.

4. .......................................................................................................
5. .......................................................................................................

- පහත සඳහන් පදවල තේරුම ලියන්න.

6. මහලුළු ගෙදර - ...............................................................................
7. ගොම්මන - ...............................................................................
8. ගොම්පස් - ...............................................................................
9. වැසි වසිද්දී සෙල්ලම් ඔරු යවමින් දරුවෝ සතුටු වූහ.
ඉරි ඇඳි පදය කවර ක්‍රියා වර්ගයකට අයත් ද? ........................................................

- ගංවතුර වේගයෙන් ගලන විට පොඩි නැන්දා කම්මුලෙහි අත තබා ගෙන දුකින් බලා සිටියා ය.
මෙහි සඳහන්

10. නාම විශේෂණ පදයක් ලියන්න ...............................................................................
11. ක්‍රියා විශේෂණ පදයක් ලියන්න ...............................................................................

- පහත සඳහන් පද්‍යයෙහි ඇති නිපාත පදයක් , උපසර්ග පදයක් උපුටා ලියන්න.

සුසිනිඳු සුදු සේල ඉණවට දවට ගෙන
සරාසඳක් සේ වඩිනා බලනු මැන

12. නිපාත පදයක් - ....................................
13. උපසර්ග පදයක් - ....................................

• පහත සඳහන් වාක්‍යවලට සුදුසු විරාම ලකුණු යොදන්න.

14. අම්මා අපේ ජාතිත් වාසනාවන්

15. අන්ධකාර රාත්‍රියක් බල්ලකු උඩුබුරන හඬ තනි වූ මිනිසෙක්

• පහත සඳහන් වාක්‍ය නිදොස් කොට නැවත ලියන්න.

16. තාරකාවෝ අහසේ බබළයි.

..............................................................................................................

17. මැණියෝ අපට ඔවදන් දෙයි.

..............................................................................................................

18. කෙනෙක් දහමෙහි හැසිරෙයි.

..............................................................................................................

19. පුෂ්ප සුවඳ විහිදුවති.

..............................................................................................................

20. භික්ෂූහු දහම් දෙසයි.

..............................................................................................................

(ල - 2 X 20 = 40)

## II කොටස

1 සහ 2 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. ඔබ පන්ති කාමරයේදී ඇගයීම් ප්‍රභේදයක් ලෙස සකස් කළ නාට්‍ය පිටපත් නිර්මාණය ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) නාට්‍ය පිටපත නිර්මාණය කිරීම සඳහා ඔබට ලැබුණු ජන කතාවේ නම කුමක් ද? (ල 3)

(ආ) නාට්‍ය නිර්මාණය කිරීමේදී ඉස්මතු විය යුතු අවස්ථා කුමන නමකින් හඳුන්වා දුන්නේ ද? (ල 3)

(ඉ) නාට්‍යයේ කාලය විනාඩි කීයක් විය යුතු ය යි උපදෙස් ලැබුණේ ද? (ල 3)

(ඊ) නාට්‍යය සඳහා ඔබ යොදා ගත් චරිත දෙකක් ලියන්න. (ල 4)

(උ) මෙවැනි නාට්‍ය පිටපතක් නිර්මාණය කිරීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජනයක් ලියන්න. (ල 3)

2. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 200කට නොඅඩු රචනයක් ලියන්න.

(අ) වන්දනීය වූ ශ්‍රී ලංකා

(ආ) ගැමි දිවියට සමීප වූ ජනකතා

(ඉ) අපේ ගොවි සිරිත්

(ඊ) බස සරසන ප්‍රස්තාව පිරුළු

(උ) සාරධර්ම සුරකින සමාජයක අවශ්‍යතාව (ල14)

3. 2013.11.16 වන දිනට උපන් දිනය යෙදෙන ඔබේ මිතුරාට / මිතුරියට යැවීම සඳහා උපන් දින සුබ පැතුම් පතක් සකස් කරන්න. (ල 10)

4. (i) "යායෙ ලියදි පැහුං වැටෙන කොට වටේ ම ඉන්න කුරුලු කොබෙයි වහ වැටෙනවා"

(අ) මෙම පාඨය උපුටා ගත් පාඩමේ නම ලියන්න.

(ආ) කුමන ප්‍රදේශයක කතා බහ ඇසුරින් මෙම පාඩම සකස් වී තිබේ ද?

(ii) "එහෙනම් මුළු රට ම ඔහුටයි"

(අ) මෙසේ කීවේ කවුරුන් විසින් ද?

(ආ) මෙය අසා සිටියේ කවරෙක් ද?

(iii) "එසේ වී නම් දරුව, වැවට ගොස් නාහපියා එව"

(අ) මෙසේ කීවේ කවුරුන් විසින් ද?

(ආ) මේ ප්‍රකාශය කළේ කොහිදී ද?

(iv) "ඉතිං කාටවත් බැරිනං - ඒකත් මං කොටන්නංකෝ"

(අ) මෙම පාඨය උපුටා ගත් පාඩම ලියන්න.

(ආ) එම පාඩම ලියා ඇත්තේ කවරෙක් ද?

(v) "මං ඊයෙ රෑ දැක්කෙ එසේ මෙසේ හීනයක් නෙවෙයි"

(අ) මෙසේ කීවේ කවුරුන් විසින් ද?

(ආ) මෙය අසා සිටියේ කවරෙක් ද?

(ල 2x5=10)

5. පහත සඳහන් පද්‍ය පන්තිය කියවා රසාස්වාදයක් ලියන්න.

සුරතල් පොඩි හා පැට වා
අරගෙන උකුලේ ඉඳ වා
කිරිවතුරින් නාවා ලා
හඳහාමි මේ එන වා

උඹ වටකර අත්වැල් බැ ඳ
ඉන්නා වූ මේ තරු ක ඳ
හඳහාමිගෙ දරු පැටව් ද?
උන් මොකට ද මාව මදි ද?

එළි වෙන්නට පළමු සැ රෙන්
පැන යන්නේ අපට හො රෙන්
ඉරු දෙවිඳුට බයෙන් නේ ද?
හඳහාමි වරෙන් ව රෙන්

(ල 10)

6. පහත සඳහන් පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දුම්බර වෙල්ලස්ස උලපන බිම් තැන්නේ
නැංවූ එදා ඔබෙ රණ ගොස අස මින්නේ
සිංහල සෙනඟ මහ පොර පිටියට පැන්නේ
කන්දක් ගරා හෙන සැඩ වතුරක් වැන්නේ

ඇඳි පට සළුව සෝදා දළදා හිමිට
පුද කොට නැමද යොදවා සිත බණ පොතට
මරණෙට මුහුණ පෑ කැප්පෙටිපොළ නමට
ගරු කටයුතු ය මුළු රට එකතුව එකට

(අ) රණබිම ඇසුණු ප්‍රදේශ දෙකක් ලියන්න.

(ආ) මෙහි සඳහන් පුද්ගලයා දළදා හිමිට පූජා කළේ මොනවා ද?

(ඉ) සිංහල සෙනඟ පොර පිටියට ඇදී ආ අයුරු දක්වා ඇති උපමාව ලියන්න.

(ඊ) මෙහි සඳහන් ආකාරයට බණ පොතට සිත යොදා මරණයට මුහුණ පෑවේ කවරෙක් ද?

(උ) මුළු රට එකතුව කළ යුතු කාර්යයක් ලෙස කවියා දක්වන්නේ කුමක් ද?

(ල 2x5=10)

7. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

ජනකාන්ත කලාවක් වන ගීතය අසා රසවිඳිය යුත්තකි. එබැවින් එහි මූලික අංගයක් වන්නේ අර්ථවත්වූත්, ශ්‍රවණ රමණීයවූත් පදමාලාවක් තිබීමයි. ගීතයක පදමාලාව සංගීත ස්වර රචනාවක් මත පිහිටා ගායනා කළ හැකි කාව්‍යමය නිර්මාණයක් විය යුතු ය. ඒ අනුව ගීතයක තවත් වැදගත් අංගයක් වන්නේ සංගීතය යි. එයින් පදමාලාවේ අර්ථයට උචිත රිද්මයානුකූල සංගීත රටාවක් නිර්මාණය වෙයි. සංගීතය සමග මුසු වූ පදමාලාව ගායනා කිරීමෙන් ගීතයක් බවට පත් වෙයි. ඒ අනුව කවියා, සංගීතඥයා සහ ගායකයා යන නිර්මාණකරුවන්ගේ දායකත්වයෙන් ගීතය යන කලා නිර්මාණය බිහි වෙයි.

(අ) මෙහි දැක්වෙන ආකාරයට ගීතයක මූලික අංගය කුමක් ද?

(ආ) මේ ඡේදයට අනුව ගීතයක් රසවිඳිය යුත්තේ කෙසේ ද?

(ඉ) ගීතයක පදමාලාව ගායනා කිරීමට උදවු වන්නේ කුමක් ද?

(ඊ) ලේඛකයා දක්වන ආකාරයට ගීතය කලා නිර්මාණයක් බවට පත් කිරීමට දායකවන්නේ කවරහු ද?

(උ) මෙම ගද්‍ය කොටසට සුදුසු මාතෘකාවක් යොදන්න.

(ල 2x5=10)